දිවි තොර කරගැනීම් යනු සුළු කොට නොතැකිය යුතු මහජන සෞඛ්‍ය ගැටළුවකි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2021 වසර තුළ ශ්‍රී ලංකාවේ 3,279 දෙනෙකු දිවි තොර කරගෙන ඇතැයි පොලිස් සංඛ්‍යාලේඛන පවසයි. මෙම සෑම දිවි තොර කරගැනීමකටම දිවි තොර කරගැනීමට උත්සාහ කිරීම් ද සිදුවන බවද පැවසිය යුතු වේ. එනිසා, දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කළ යුතු අතර, එසේ කිරීමේදී ප්‍රවේසම් සහගත හා ආචාර ධාර්මික ප්‍රවේශයක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

වෙහෙරගලකන්දේ හිමි නමක් දිවි තොර කරගත් බවට වන පුවත අරුණ පුවත්පතේ (ජූනි 03, 2022) වාර්තා වී ඇති ආකාරය එහිදී නිරීක්ෂණය කළ හැක. මෙම පුවත් වාර්තාව තුළ,

1) දිවි තොර කරගත් අයුරු සඳහන්ව තිබේ. එය එම ක්‍රමය භාවිතා කරමින් සිදුවිය හැකි අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා උත්ප්‍රේරකයක් විය හැක.

2) උපකාරක අංක සඳහන් නොවේ. හදිසි උපකාරක අංක දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් හා පළ කිරීමෙන්, දිවි තොර කරගැනීමේ නැඹුරුව ඇති එක් අයෙකුගේ හෝ ජීවිතයක් බේරාගැනීමට අවකාශ ලැබිය හැක.

එසේ නම්, මෙවැනි පුවත් වාර්තා කිරීමේදී හැකිතාක් දුරට දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුගත වීම මාධ්‍ය අත රැඳි වගකීමක් නොවන්නේ ද?

(මෙම පුවත එදින සහෝදර ඉංග්‍රීසි පුවත්පත වන The Morning තුළ වාර්තා වී නොතිබුණි.)

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...